328

RARE

# ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය කළමනාකරණය

(ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ රූපවාහිනී සංස්ථාවට
විශේෂිතව කෙරෙන ජන මාධ්‍ය කළමනාකරණය පිළිබඳ
ෂර්යේෂණයකි.)

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 328 |
| වර්ග අංකය | |

කැළණිය විශ්වවිද්‍යාලය
දර්ශනපති උපාධිය
එච්.එම්.එච්. සිරිවර්ධන
2004 - ජුලි

1 - JUL 2006

## සාරාංශය

ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය කළමනාරකණය පිළිබඳව මා දැනුවත්ව මේ වනතුරු (1997 - 2004) කිසිදු ශාස්ත්‍රීය පර්යේෂණයක් සිදු කෙරී නැත. ඒ අනුව මෙම පර්යේෂණය ක්ෂේත්‍රය සඳහා වන පුරෝගාමී පර්යේෂණයකි.

ශ්‍රී ලංකාව සංවර්ධනය අපේක්ෂාවෙන් ක්‍රියාත්මක රටකි. එම නිසා ජාතික අරමුණු ඉෂ්ඨ කර ගැනිමට ක්‍රියාත්මක ජාතික මෙහෙයුම්වලදී ජනමාධ්‍ය ඇතුළු සන්නිවේදනය මගින් කළ හැකි මෙහෙය ඉතා පුළුල්ය. ඒ අතරින් විද්‍යුත් මාධ්‍ය ජනතාවට වඩාත් බලපෑම් සහිත වන මාධ්‍යයකි. ඒ අනුව ශ්‍රව්‍ය මාධ්‍යයෙන් ගුවන් විදුලිය ද ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් රූපවාහිනිය ද ශ්‍රී ලාංකේය ග්‍රාහක විඥානය කෙරෙහි වඩාත් බලසම්පන්න ලෙස හැසිරෙන්නට පටන්ගෙන ඇත. එසේ වුවද එකී බලසම්පන්න බව ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව පොදු ග්‍රාහකයා කෙරෙහි බලපෑම් සහිත නොවන බවටත් එසේ වීමට ප්‍රධාන හේතුව විද්‍යුත් මාධ්‍ය සඳහා වන කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමකින් ක්‍රියාත්මක නොවීමත් බවට විවිධ ජන කණ්ඩායම් අතරින් චෝදනා සහ මතවාද නැගෙමින් පවති. ඒ අතරින් ශ්‍රී ලංකා රූපවාහිනිය සහ ගුවන් විදුලිය ජාතික අරමුණු ඉෂ්ඨ කිරීම උදෙසා සිය කළමනාකරණ ප්‍රතිපත්ති මෙහෙයවන්නේ නැති බවට නැගෙන චෝදනාව ප්‍රබලය. මෙම පර්යේෂණයේදී උක්ත වි ද්‍යුත් මාධ්‍ය ද්විත්වයේ කළමනාකරණ ක්‍රියාකාරිත්වය හා එහි අවසාන ඉලක්කය වන ග්‍රාහක අරමුණු සහ අභිලාෂයන් ඉෂ්ට වීම පිළිබඳව ද සාකච්ඡා කෙරේ.

ජනමාධ්‍ය ක්ෂේත්‍රය වෙනත් විවිධ විෂයයන් සහ දියුණු තාක්ෂණ උපයෝගිත්වයෙන් වර්ධනය වෙමින් පවති. කළමනාකරණය ද ජනමාධ්‍ය භාවිතාවේ සහ අධ්‍යයනයේ ඉතා වැදගත් අංශයක් බවට පත්ව ඇත. විද්‍යුත් මාධ්‍ය ආයතනවල භාවිත කළමනාකරණය, ඒවායෙහි අවගමනය හෝ ප්‍රගමනය කෙරෙහි බලපෑම් කර තිබේද, ඒවා මොනවාද ඒ කවර අංශ කෙරෙහිද? යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

පළමු පරිච්ඡේදයේදී කළමනාකරණ න්‍යායන් සිද්ධාන්ත සහ සංකල්ප ඇසුරින් විද්‍යුත් මාධ්‍ය කළමනාකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කොට ඇත. මෙහිදී විශේෂ අවධානය යොමු කරන ලද්දේ කළමනාකරණය යන්න හඳුනා ගැනීම සඳහායි. එහි අරමුණු, න්‍යායයන්, නිර්වචනය සහ ක්‍රියාකාරිත්වය සහ කාර්යයන් පිළිබඳව පුළුල්ව අධ්‍යයනය කරන ලදි.

දෙවන පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ මාධ්‍ය සංවර්ධනය සහ කළමනාකරණය පිළිබඳ ඓතිහාසික විමර්ශනයක් සිදු කෙරේ. මෙහි දී ශ්‍රී ලංකාවට විද්‍යුත් මාධ්‍ය වශයෙන් ගුවන් වි

දුලිය ප්‍රවිෂ්ට වීමත්, ස්ථාපනය සහ ව්‍යාප්තිය මෙන්ම පසුකාලීනව ඇති වන විවිධ පරිපාලන සහ කළමනාකරණ වෙනස්වීම් සහ ඒවායෙහි විවිධ ස්වරූපයන් ද අධ්‍යයනය කරන ලදි. මෙහිදි විවිධ කොමිසම් වර්තා සහ ගුවන් විදුලිය සහ එහි කළමනාකරණය කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුව තුළ සිදු කරන ලද සාකච්ජා මෙන්ම ගුවන් විදුලියේ විවිධ සංධිස්ථාන සහ විශේෂයෙන් ගුවන් විදුලි පනතක් ගෙන ඒම පිළිබඳව ද අධ්‍යයනය කරන ලදි. එම පරිච්ඡේදයේදි රූපවාහිනියේ ප්‍රවිෂ් වීම, ස්ථාපනය හා ව්‍යප්තිය සාකච්ජා කෙරේ.

විද්‍යුත් මාධ්‍ය කළමනාකරණයේ දි මාධ්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇති කර ගැනිම ජනතාවාදි යහපත් මාධ්‍ය කළමනාකරණයක් පවත්වා ගැනිමට උපකාරීවේ. තෙවන පරිච්ඡේදයේදි විද්‍යුත් මාධ්‍ය, එහි කාර්යභාරය සහ කළමනාකරණ ප්‍රතිපත්තියක අවශ්‍යතාව පිළිබඳ සාකච්ජා කොට ඇත. සිව්වන පරිච්ඡේදයේදි විද්‍යුත් මාධ්‍ය කළමනාකරණය කෙරෙහි බලපාන පාරිසරික සාධක පිළිබඳ සාකච්ජා කෙරේ.

පස්වන පරිච්ඡේදයේදි ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය කළමනාකරණය පිළිබඳ පර්යේෂණය තුළින් හඳුනා ගැනෙන නව මානයන් කවරේද යන්න ඉදිරිපත් කෙරේ. හයවන පරිච්ඡේදය නිගමන සහ යෝජනා සඳහා වෙන් කොට ඇත. එහිදි පර්යේෂණය සිදු කිරීමට අදාලව පුළුල් විස්තරයක් අඩංගු වේ.